**වාරියපොළ ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වාරියපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රු.6,223,438 ක් වු ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් තුලින් ප්‍රාග්ධනිත කිරිමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ නොකළ සංවර්ධන ව්‍යාපෘති 21 කට අදාළ ඇස්තමේන්තු වටිනාකම රු.48,393,117 ක් ණය හිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | කඩිනමින් මෙම ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | වටිනාකම රු.620,000 ක් වු ඉඩම් 06 ක වටිනාකම හා පොත්පත්වල සටහන් නොවු ඉඩම් 5 ක් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | මෙම අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කරගන්නා බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (ඊ) වගන්තිය | සභා බල ප්‍රදේශයේ ස්ථානගත කර තිබූ දැන්වීම් පුවරු 55 කින් 2022 වර්ෂය තුළ දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබුණි. | මෙම මුදල්වලින් කිහිපයක් මේ වන විට අයකරගෙන ඇති අතර ඉතිරි මුදල්ද කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | අදාළ වගන්තියේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,389,236 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,431,413 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ආදායම්, බිල්කල හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම් රු. 000 | බිල්කළ ආදායම් රු. 000 | රැස්කළ ආදායම් රු. 000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 | ඇස්තමේන්තු ගතආදායම් රු. 000 | බිල්කළ ආදායම් රු. 000 | රැස්කළ ආදායම් රු. 000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 |
| I. | වරිපනම් හා බදු | 103,301 | 9,261 | 3276 | 5,984 | 1,037 | 8941 | 4,076 | 486 |
| II. | කුලී | 163,747 | 13,205 | 12,736 | 4,688 | 19,169 | 135,326 | 101,997 | 3,332 |
| III. | බලපත්‍ර ගාස්තු | 16,765 | 9,302 | 9,000 | 30 | 13,225 | 957 | 957 | - |
| IV. | වෙනත් ආදායම් | 143,665 | 872,147 | 16,275 | 973 | 25,879 | 14,500 | 13,368 | 11,321 |
| එකතුව | | 427,747 | 903,915 | 41,287 | 11,675 | 59,310 | 159,724 | 120,398 | 15,139 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුළු හිඟ වරිපනම් ශේෂය වූ රු.5,803,760 න් වර්ෂ 05 කට වැඩි හිඟ ශේෂය රු.244,063 ක් ද, වර්ෂ 01 -03 අතර හිඟ ශේෂය රු.1,912,124 ක් ද විය. | නොගෙවන අය වෙත දේපල තහනම් කිරිම ආදිය මගින් ඉතිරි හිග ආදායම්ද අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට පැරණි අක්කර බදු හිඟ ශේෂය රු.128,119 ක් සහ ප්‍රවර්ථන වර්ෂයේ අක්කර බදු හිඟ ශේෂය රු.22,416 ක් ලෙස රු.150,535 ක හිඟ ශේෂයක් සභාවට අයවිය යුතුව පැවතුණි. | ඉදිරි වැඩ සටහන් මගින් අයකරගැනීමට කටයුතු කරන බව. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 14 කට ලැබිය යුතු ශේෂය රු.204,049,443 ක් වූ අතර එයින් රු.2,027,873 ක් වසර 05 ක් ඉක්මවා පැවතුණි. | කර්මාන්ත ණයගැති මුදල්,මුද්දර ගාස්තු සහ උසාවි දඩ හිග මුදල් ආදී මුදල් හැකි ඉක්මණින් නිදහස් කර ගැනිම සඳහා කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 10 දිනැති වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 03 කට වරක් කඩකාමර තක්සේරු කළයුතු වුවද බස් නැවතුම්පල කඩ කාමර සහ සුළු පරිමාන වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2016 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව අයකරමින් පැවතුණි. | 2022 වර්ෂයේ සිටම කිහිප අවස්ථාවක අප විසින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මෙම කඩ කාමර තක්සේරු කර දෙන ලෙස ඉල්ලීම් ලිපි යවා ඇති බව. | කඩකාමර කාලීනව තක්සේරු කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට සේවකයින් 18 දෙනෙකුට අදාලව රු.13,956 ක අය නොවන සේවක ණය ශේෂයක් පැවතුණි. | තොරතුරු සොයා බලා අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | සේවක ණය නිසි පරිදි අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව භාවිතාකරන ඉඩම් ගොඩනැඟිලි 115ක් සහ කැබ් රථයක් සහ ජීප් රථයක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් පවරා ගැනීම සඳහා අවශ්‍ය සියළු කටයුතු ඉදිරියේදී සිදු කරන බව. | සභාව භාවිතාකරන වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නියමිත පරිදි වැඩ නිම නොකිරීම හේතුවෙන් ගිමන්හල කඩ කාමර 08 ක්, පානීය ජල ව්‍යාපෘතිය, සහ බස් නැවතුම්පල පරිශ්‍රයේ එළවළු හා පළතුරු කඩ සමාලෝචිත වර්ෂය තුල නිෂ්ක්‍රීයව පැවතුණි. | ගිමන් හල විදුලිය ලැබීමෙන් පසු විවෘත කරන බවත්,වල්පොල පානීය ජල ව්‍යාපෘතිය කඩිනමින් ජනතා අයිතියට පත් කරන බවත්, බස් නැවතුම්පළ පරිශ්‍රයේ එළවළු හා පළතුරු කඩ ද කඩිනමින් වැඩ අවසන් කර ජනතා අයිතියට පත් කරන බව. | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 15 සිට 99 දක්වා විචලනයක් ද වියදම් විෂයයන් 87 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 75 කට වඩා වැඩි විචලනයක් ද නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | මින් ඉදිරියට මෙවැනි දුර්වලතාවයන් ඇති නොවන ආකාරයට මෙම විචලනයන් පිළිබද පරීක්ෂා කර බලා කටයුතු කිරීමට නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව. | තාත්විකව අයවැය පිළියෙල කිරීමට හා එය මත පදනම්ව ප්‍රතිපාදන ප්‍රශස්තව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |